පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක : 492

ආයතනයේ නම : **ඌව පළාත් සභාව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

பாராளுமன்ற வெளியீட்டு தொடர் இல: 492

நிறுவனத்தின் பெயர் : **ஊவா மாகாண சபை**

பாராளுமன்றத்தின் அரசக் கணக்குகள் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக, நிலையியற் கட்டளை இலக்கம் 119(4)-இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No 492

Name Of The Institute : - **Uva Province**

Submission Of Observations Of Hon Minister And Steps Taken With Regard To The Reports Tabled By The Committee On Public Accounts In Terms Of Standing Order No 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - ඌව පළාත් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
492	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතය.
	පලාත් සභාවේ සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා ආයතන ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.	පළාත් සභාවේ සියලු අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතන ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු එම වසරවල රටේ පැවති අයහපත් තත්ත්වය මත පැවැත්වීමට නොහැකි විය. නමුත් මේ වන විට අදාළ විගණන හා කළමනාකරණ කමිටු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
	පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කරන ලෙස සියලු ආයතනවලට උපදෙස් ලබා දී ඇත.
	අග්‍රීම ශේෂ වසරකට වඩා වැඩි කාලයකට රඳවාගෙන තිබුණි.	නොපිය වූ අග්‍රීම ශේෂ පියවා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව 2025/12/03 වන විට නොපිය වූ අග්‍රීම ශේෂයන් නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක - 492

ඔබ ආයතනයේ නම - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගත් කරුණු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
492	ලැබෙන වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම.	ලැබෙන වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යන අතර පරීක්ෂණයට පැමිණි අවස්ථාවේ යම් ප්‍රමාද දෝෂයකින් ඒ අවස්ථාවේ එම ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය.
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබීම.	මෙවන විට දෙපාර්තමේන්තුව තුළ විගණන කලමණාකරණ කමිටුවක් පිහිටුවා විගණනයට ලක්විය හැකි කරුණු හා අතපසුවූ කරුණු සොයාබලා කටයුතු කර ඇති අතර ඉදිරි වර්ෂය ආරම්භයේදී විගණන වැඩසටහන් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. මෙවන විට ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අංක UPC/IA/ACC/02/01-1 හා 2025.05.26 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව කාර්තුමය ඇගයීම් වාර්තාව විධිමත්ව සකස් කර පවත්වාගෙන යන බව කාරුණිකව දන්වා සිටිමි.
	මසක්තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතන මඟින් පාලනයවන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල හා ඒ යටතේ ඇති කෘෂිකර්ම උපදේශක කාර්යාලවලට ඉදිරිපත් වී ඇති විගණන විමසුම් සඳහා අදාළ පරීක්ෂණ කටයුතු පවත්වා නිවැරදි පිළිතුරු වාර්තාව සකස් කිරීමේදී යම් යම් අවස්ථාවලදී මසකට වඩා වැඩි කාලයක් ගත වුවත් ඒ අතරතුර කාලයේ අතුරු පිළිතුරක් යැවීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී අවමය මසකට අඩු කාලයකින් සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු ලබාදීමට උත්සාහ කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රේ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබීම.	පෙර වර්ෂයේදී එවැනි ගැටළු පැවති අතර එය නිවැරදි කිරීමට කටයුතු කර මෙවන විට අප්‍රමාදව මු.රේ. ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි.

	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබීම.	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය දැනට පියවීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී පමාවකින් තොරව සිදු කිරීමට වගබලා ගැනීමට කටයුතු කරමු.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය මත වරකට උපරිමය රු.100,000 සීමාව තුල තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර ඇති අතර ඒ අනුව අනුමත සීමාව ඉක්මවා කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.
	පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබීම.	මේවන විට පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් පළාත් මුදල් රීති ප්‍රකාරව කටයුතු කර ඇති අතර එසේම මූල්‍ය විනයකින් යුක්තව කටයුතු කරන බව දන්වා සිටිමි.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමණාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කෘෂිකර්ම අමාත්‍යාංශය හා පළාත් සභාව මඟින් දැනුම්දුන් අවස්ථාවලදී අදාළ රැස්වීම් සඳහා සහභාගී වී ඇති අතර මේවන විට දෙපාර්තමේන්තුව තුළ විගණන කළමණාකරණ කමිටුවක් පිහිටුවා එමගින් කාර්තුවට වරක් රැස්වීම් පවත්වා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	මු.රේ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලකා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	වර්ෂයට අදාළ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබීම හා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කළ නොහැකි අවස්ථාවලදී අත්‍යාවශ්‍ය ගෙවීම් සිදුකිරීම සඳහා බැරකම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී එවැනි තත්ත්වයන් වළක්වා ගනිමින් කටයුතු කරන බව කාරුණික සඳහන් කරමි.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ඇතැම් වැය විෂයන් සඳහා වවුචර්පත් ඉදිරිපත් වේ යැයි අපේක්ෂාවෙන් ප්‍රතිපාදන වෙන්කර ගැනීම සිදුකරනු ලැබුවද විවිධ හේතූන් මත එම වැය විෂයන් යටතේ වවුචර්පත් ඉදිරිපත් නොවීම මත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වේ. ඉදිරියේදී මෙවැනි තත්වයන් අවම කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අත්තිකාරම් බී ගිණුම යටතේ ස්ථානමාරු ගිය නිලධාරීන් හා සේවකයන් කිහිපදෙනෙකුගේ හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා එම නිලධාරීන් මේවන විට සේවයේ යෙදී සිටින ආයතන හා ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර නිරන්තරයෙන් එම ණය ශේෂ ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	ඉන්ධන ගැටළු පවතින අවස්ථාවලදී නිලධාරීන්ට ලැබුණු සහන වශයෙන් පදිංචි ප්‍රදේශය තුලට නිලධාරීන් ස්ථානගත කිරීම නිසා මොණරාගල කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය තුල නිලධාරී අතිරික්තයක් පෙන්නුම් කරන අතර අනිකුත් ආයතනයන්හි නිලධාරී හිඟතාවයක් පෙන්නුම් කරයි. එය ඉදිරියේදී තුලනය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

දෙවන කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගත් කරුණු	ආයතනය විසින් ලබා දෙන පිළිතුරු
492	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ඉදිරිපත් නොකළ නිළධාරීන්, මාගේ අංක පකෘදෙ/ආ/ 03/01/05 හා 2024.08.20 දිනැති ලිපිය මඟින් දැනුවත් කරන ලද අතර ඉදිරියේදී සියළු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. මේ වන විට මාර්ගගත ක්‍රමය ඔස්සේ නියමිත දිනට වත්කම් බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම අදාළ නිලධාරියාගේ වගකීමක් බව පෙන්වා දී ඇත.
	පළාත් නීති ප්‍රකාරව අයකළ යුතු අධිභාර අයකර නොතිබීම.	විගණන විමසුම්වලදී 2023 මුදල් වර්ෂයේ අයකළ යුතු අධිබාර අයකර නොමැතිබව පෙන්වා දී තිබූ නමුත් එසේ අයකළ යුතු අධිභාර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.
	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම/ ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.	ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් (web site) තිබුණද මෙවන විට එය මහජනතාවට උපරිම ඵලදායීතාවක් ලබාගැනීම සඳහා අවශ්‍ය පරිදි සකස් කරමින් පවතී. ඉදිරියේදී මහජනතාවට ඵලදායී ලෙස පරිශීලනය කළ හැකි බව කාරුණිකව දන්වා සිටින අතර මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන මුහුණු පොත (face book) වට්ස් ඇප් කණ්ඩායම (whatsapp group) මගින් ඉතා ඵලදායී ලෙස දැනටමත් ජනතාව දැනුවත් කරමින් සිටින අතර පැමිණිලි හෝ ප්‍රසංශාද ලබාගෙන ඒ සම්බන්ධව දිරිකටයුතු කරන බව දන්වා සිටිමි.

	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතීම.	සැලසුම්ගත පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය හැකිතාක් සහභාගී කර ඇති අතර ඉදිරියේදී එය වඩාත් ඉහල නැංවීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටින අතර ආයතනය තුළ සැලසුම්සහගතව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉදිරියේදී 70%ට වඩා වැඩි අවස්ථා ප්‍රමාණයකට පුහුණුවීම් ලබාදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ විගණන මතය "සතුටුදායකයි" ලෙස සඳහන් කර ඇත.
	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	රජයේ ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග පිළිබඳව සැලකිලිමත් වෙමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණික දන්වා සිටිමි.
	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	පළාත් ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග පිළිබඳව සැලකිලිමත් වෙමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණික දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාවේ අංකය - 492

ආයතනයේ නම - ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අදාල ආයතනය විසින් වර්තමානයේදී එම තත්ත්වයන් යාවත්කාලීන කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග
492	වර්ෂයට අදාල විසර්ජන ගිණුම හා අත්තිකාරම් ගිණුම නියමිත දිනය ඉදිරිපත් කර නැත.	කාර්ය මණ්ඩලයේ සිදුවූ ස්ථාන මාරුවීම් නිසා ඇතිවූ ගැටළුකාරී තත්වය හේතුවෙන් එම වර්ෂයේ ගිණුම් නිසි වේලාවට ඉදිරිපත් කිරීමට නොහැකිවී තිබූ අතර මේ වන විට එම තත්ත්වය විසඳී ඇත. ඒ අනුව 2024 වර්ෂයට හා 2025 වර්ෂයට අදාල ගිණුම් වාර්තා / බැංකු සැසඳුම් නියමිත දිනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අණාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රේ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව විසින් පේෂකර්ම හා කුඩා කර්මාන්ත යටතේ වාණිජ ගිණුම් පවත්වාගෙන යන අතර, ණය පදනම මත රෙදිපිළි හා ගෘහ භාණ්ඩ අලෙවි කරනු ලබයි.මෙම භාණ්ඩ සහන පදනම මත ලබා ගන්නා පාරිභෝගිකයින් විසින් බැංකුව වෙත සෘජුවම මුදල් තැන්පත් කර එම කුවිතාන්සි ඉදිරිපත් නොකරීම නිසා සෘජු බැර පවතින අතර 2023.12.31 දිනට පහත ආකාරයට පැවති සෘජු බැර ශේෂයන් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත. 2023.12.31 දිනට පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,286,810.00 වූ අතර, මේ වන විට රු. 9,562.00 දක්වා ශේෂය අඩු කර ගැනීමට කටයුතු කර ඇත. 2023.12.31 දිනට කුඩා කර්මාන්ත වාණිජ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.193,690.00වූ අතර,මේවන විට එම ශේෂය 62,848.00 දක්වා අඩු කර ගැනීමට කටයුතු කර ඇත.
	වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	2024 හා 2025 වර්ෂ වලදී එසේ නොවීමට කටයුතු කර ඇත.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම	2023 වර්ෂයේදී පහත පරිදි හිඟ ණය ශේෂ පැවති අතර, හිඟ ශේෂ අයකර ගැනීම යාවත්කාලීන කිරීමට මූලික පියවර ගෙන ඇති බැවින් පහත පරිදි ගිණුම් වල හිඟ ශේෂ අඩු කර ගැනීමට හැකිවී ඇත.

		2023.12.31 දිනට අත්තිකාරම් බී ගිණුමේ මියගිය, වැඩ තහනම් කළ , පළාත් පාලන ආයතන වලට ස්ථානමාරුවූ නිලධාරීන් ගේ ශේෂය ලෙස රු.276,029.00ක් පැවති අතර මේවන විට ස්ථානමාරුවූ නිලධාරිනියකගෙන් ණය ශේෂ අය වෙමින් පවතින අතර, වයස අවු.45න් පත්විමගත් දැනට විශ්‍රාමික ගොස් ඇති සේවකයින් 05කුගේ විශ්‍රාම වැටුප් නිරවුල් වී නොමැති නිසා මේ වන විට රු.89,150.00ක් දක්වා අඩුවී ඇත.
		2023.12.31 දිනට පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.15,303,909.96ක් වූ අතර,2025.12.31 වන විට එම අයවීමට ඇති ශේෂය රු. 824,303.26 දක්වා අඩුකර ගැනීමට කටයුතු කර ඇත.
		2023.12.31 දිනට කුඩාකර්මාන්ත වාණිජ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.4,531,747.61වූ අතර, 2025.12.31 වන දිනට අයවීමට ඇති ශේෂය රු. 417,406.53 දක්වා අඩු කර ගැනීමට කටයුතු කර ඇත

දෙවන කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අදාල ආයතනය විසින් වර්තමානයේදී එම තත්ත්වයන් යාවත්කාලීන කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග.
492	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් නොතිබීම.	මෙහි අධීක්ෂණ කටයුතු පරිපාලන නිලධාරි වෙත පවරා ඇති අතර, ඒ අනුව සිදුකරන වාර්තා කිරීම් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා විසින් මාසිකව පවත්වන කාර්ය මණ්ඩල රැස්වීම් වලදී දැනුවත් කර නිවැරැදි කිරීමට කටයුතු කරමින් ඇත.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.
	පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම.	වර්ෂයට අදාල පුහුණු සිදු කර ඇත.

	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	විගණන මතය යටත් මට්ටමේ මතයක් වන අතර විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාල අඩුපාඩු නිවැරැදි කර ගැනීමට කටයුතු සලසා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාවේ අංකය-492

ආයතනයේ නම-ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාවේ පිටු අංකය 492	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
147	හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.
	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමුවන මුර පදය ගණකාධිකාරි හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල නව මුරපදයක් ඇතුලත් කරන ලද අතර, එම මුරපදය ප්‍රධාන ගණකාධිකාරි භාරයේ පමණක් ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	පාසල් නිවාඩු කාල පැමිණීම වැනි හේතු නිසා කලාප අධ්‍යාපන කාර්යාල වලින් පිළිතුරු ලැබීම ප්‍රමාද වන අතර,මසක් ඇතුලත අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලබන්න අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව සඳහන් කරමි.එම වාර්තා සඳහා පිළිතුරු සකස් කිරීම පමණක් ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි.

	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වන අතිරික්ත,ඌනතා පිළිබඳව නිර්දේශ නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	41-6655 දරන ලොරි රථය නැවැත අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි.
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි.
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු නොතිබුණි	කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කල යුතු අය වෙත නිරවුල් කිරීමටත්,අනෙකුත් කල් ඉකුත් වූ තැන්පත් රජයේ ආදායමට බැර කිරීමටත් කටයුතු කරන ලද බව කාරුනිකව සඳහන් කරමි.
	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට ඵළඹ තිබුණි.	ඉදිරියේදී මෙම දෝෂයන් වළක්වා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
147	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුලු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරික්ෂණය විය.	ඉදිරි ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම තත්ත්වයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	අදාල අත්තිකාරම් කාර්යය සඳහා පළාත් සභාව විසින් පනවා තිබුණු සීමාවන්	ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව කාරුනකාව සඳහන් කරමි.

	පිළිපැද නොතිබුණි.	
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවැත එන හිඟ ණය ශේෂ පැවැතුණි.	හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩල බඳවා ගෙන තිබුණි	වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේදී මෙම තත්ත්වයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

දෙවන කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාවේ පිටු අංකය 492	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
147	ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.3 වගන්තියේ විධි විධාන පූර්ණ වශයෙන් ඉටු නොකර මාරු වීම් සම්බන්ධව කටයුතු කර ඇත.	ඉදිරි මැරුවීම් සිදුකිරීමේදී මෙම තත්ත්වයන් අවම කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.
	සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්යය මණ්ඩලය සඳහාම කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : පළාත් පාලන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	වර්තමාන ප්‍රගතිය
492	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අංක 54-1354 දරණ කැබ් රථයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත නොමැති අතර, ඡායා පිටපතක් පමණක් මෙම දෙපාර්තමේන්තුව සතුව පවතී. ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියට අනුව මෙම රථය ඌව පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට නිවැරදි කර ඇත.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුමත වුවද නව කර්මාන්ත ආරම්භ නොකිරීමටත්, අවිච්ඡේද යෝජනාවල අත්‍යවශ්‍ය යෙන්ම ඉටුකල යුතු කොටස් පමණක් ඉටුකර අවසන් කරන ලෙසට භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා දී තිබූ බැවින් නව යෝජනා ක්‍රියාත්මක නොකරන ලදි. ඒ අනුව, මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම සිදුවී ඇත. මේ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කර ඇත. 2023 වසරේ රයේ පැවති තත්ත්වය අනුව භාණ්ඩාගාරය අක්මුදල් නිදහස් කිරීම සීමා වූ බැවින් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සඳහාම අක් මුදල් ලබා දීම සිදු නොවන බව නිරීක්ෂණය වූ බැවින් අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණක් වියදම් කර අග්‍රිම පාලනයක් කර ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව පුනරාවර්ථන ප්‍රතිපාදන ඉතිරි විය.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මේ වන විට එක් මුරකරුවෙකු පමණක් අතිරික්තව පවතී.
	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	මේ වන විට ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මැනීම සඳහා දර්ශක නියම කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාව	කොමිසම විසින් හඳුනාගත් අඩුපාඩු	වර්තමානය වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග
492	මසක් තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය විගණනය සඳහා ඌව පළාත් අභ්‍යන්තර විගණකගේ අංක අවි/15/2003/07/95 හා 2023.08.14 දිනෙන් විගණන විමසුමක් මෙම අමාත්‍යාංශයට ලැබී ඇති අතර එම විගණන විමසුමට 7/2/9 මාගේ අංකයෙන් 2023.08.28 දින පිළිතුරක් ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත .ඒ අනුව අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් සිදුවී නොමැත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවකකානුව තුල ක්‍රියාත්මක නොකිරීම.	එම වර්ෂයේ පැවති ආර්ථික අර්බුද තත්වය හා ඉන්ධන ගැටළුව හමුවේ කාර්යාලයට නිලධාරීන් පැමිණීම සීමා කිරීම හේතුවෙන් උක්ත නිර්දේශ නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කල නොහැකි වූ අතර. මේ වන විට සියළු නිර්දේශයන් ක්‍රියාත්මක කර අවසන් කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂගේ අංක අවි/57/02 හා 2023.10.18 දින අමාත්‍යාංශය වෙත යොමු කොට ඇති ලිපිය මගින් 2023 වර්ෂයේ තෙවන කාර්තුවට අදාල විගණන කළමනාකරණ කමිටු රැස්වීම 2023.10.24 පවත්වන ලෙස දැනුම් දී ඇත. කෙසේ නමුත් 2023.11.02 දින එම රැස්වීම පවත්වා ඇති අතර නැවත හතරවන කාර්තු රැස්වීම පැවැත්වීමට කාලයක් නොමැති බැවින් පවත්වා නොමැති බව දන්වා සිටින අතර,වර්තමානය වන විට සියළුම විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත කාල වකවානුව තුලම පවත්වන බව කාරුණිකව සඳහන් කරමි.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	(අ) භාණ්ඩාගාර ලේකම්ගේ අයවැය චක්‍ර ලේඛ 01/2023 හා 2023.01.27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් අනුව හා මූලධන වියදම් සඳහා අත්‍යවශය හා ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් ප්‍රධාන ලේකම් ඇතුලු කමිටුවක් මගින් අනුමත කරන ලද මූලධන වියදම් සඳහා පමණක් කටයුතු කර ඇත. (ආ) උක්ත චක්‍රලේඛය ප්‍රකාරව වියදම් කළමනාකරණය සම්බන්ධව ලබා දී ඇති

		උපදෙස් අනුව අදාල වර්ෂයේ පුනරාවර්තන ප්‍රතිපාදන 6% අඩුරා තැබීම සිදු කරන ලදි.2023 වර්ෂයට ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ පෙර වර්ෂයේ (2022) වෙළඳපල මිල ගණන් පදනම් කර ගනිමින් බැවින් සමාලෝචිත වර්ෂය තුල වැට බද්ද ඉහල යාම,උපාංග වල මිල ඉහල යාම වැනි හේතු මත වර්ෂය තුල වෙන් කරන ලද ප්‍රතිපාදනය හාණ්ඩ මිලදී ගැනීම හා සේවා සපයා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවුනි. තව ද වියදම් සඳහා ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීමත් හේතුවෙන් ඇතැම් වැය විෂයන් සඳහා අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වීම හේතුවෙන් ඇතැම් වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරි වීමක් සිදු වූ බව කාරුණිකව දන්වා සිටිමි.

දෙවන කොටස

පිටු අංකය - පාර්ලිමේන්තු ප්‍රකාශ මාලාව 492	කොමිසම විසින් හඳුනාගත් අඩුපාඩු	වර්තමානය වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග
492	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව 2023-2027 මානව සම්පත් සංවර්ධන සැලැස්ම මේ වන විට පිළියෙල කර ඇත. (ඇමුණුම 01)
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්යමණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2023 වර්ෂය තුළ රට තුළ පැවති ආර්ථික අර්බුධය හමුවේ ඉන්ධන පරිභෝජනය සීමාවීම හා ප්‍රතිපාදන සීමා වීම හේතුවෙන් වර්ෂය තුල අපේක්ෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.
	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මේ වන විට නම්කර ඇත. (ඇමුණුම 02)

පාර්ලිමේන්තු මාලාවල ප්‍රශ්න අංකය 492

ආයතනයේ නම - ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

01 කොටස

පාර්ලිමේන්තු මාලාවල ප්‍රශ්න අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	කෙටිකාලීන / වත්මන් තත්වයන් නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
492	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන බණ්ඩාරවෙල සුජාතා සෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ හා ගෝතමී සෙවන ළමා මාතෘ රැකවරණ මධ්‍යස්ථානයේ නේවාසිකවී සිටින දරුවන්ගේ ප්‍රවාහන අවස්ථා ලබාදීම වෙනුවෙන් UP GI 4155 අංක දරන ත්‍රීරෝද රථය ලබාදී තිබූ අතර, කාර්මික දෝෂ රැසක් පැවතීම හේතුවෙන් කලක් අක්‍රීය ව ධාවන කටයුතු වලට භාවිතා කිරීමට නොහැකි තත්වයට පත්ව ආයතනය තුළ ගාල් කර පැවතුණි. මෙම ආයතනයේ දරුවන්ගේ ප්‍රවාහන අවශ්‍යතා වැඩිවීම හේතුවෙන් ත්‍රීරෝද රථයේ පැවති කාර්මික දෝෂ හඳුනා ගෙන අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීමෙන් පසුව ප්‍රවාහන අවශ්‍යතා සඳහා ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ඇති අතර, මේ වන විට ධාවන කටයුතු සඳහා භාවිතා කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුතු කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාදීමට කටයුතු කරන අතර, අදාල කාර්යය නිමවූ විගස හෝ අත්තිකාරම් ගෙන සති දෙකක් තුළ පියවීමට කටයුතු කරන ලෙසට මගේ අංක : ඌව/ පරි/ගි/2/3/ පොදු හා 2026.06.16 දිනැති ලිපිය මගින් සියලුම නිලධාරීන් දැනුවත් කර ඇත.

2 කොටස

පාර්ලිමේන්තු මාලාවල ප්‍රශ්න අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	කෙටිකාලීන / වත්මන් තත්වයන් නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
492	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු නිලධාරීන් 19 දෙනෙකු සිටින අතර, ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ගේ අංක : 4/AD/ES/07/02 හා 2024.05.20 දිනැති ලිපිය අනුව එම නිලධාරීන් දැනුවත් කර ඇති බවත්, 2024, හා 2025 වර්ෂවල මෙම දෙපාර්තමේන්තුවේ එම නිලධාරීන් සියලු දෙනාම වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බවත්, කාරුණිකව සඳහන් කරමි.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) හා 2023.11.30 දිනැති චක්‍රලේඛය අනුව 2024, 2025 සහ 2026 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි ඩබ්ලිව්.ඒ. අවිනි ද සිල්වා මහත්මිය නම් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අයවැය චක්‍රලේඛ අංක 01/2023 හා 2023.01.27 දිනැති චක්‍රලේඛය පරිදි පුහුණු වැඩසටහන් නොපැවැත්විණි. 2024, 2026 වර්ෂවල සැලසුම් කළ පුහුණු වැඩසටහන් පවත්වා ඇති බව කාරුණිකව සඳහන් කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **492**

ආයතනයේ නම : **උඟව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අදාල ආයතනය විසින් වර්තමානයේදී එම තත්ත්වයන් යාවත්කාලීන කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග
492	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් තර තිබුණි.	ප්‍රධාන ලේකම් ගේ පූර්ව අනුමැතියකින් තොරව අත්තිකාරම් ලබා ගෙන ඇති බව පිලිගන්නා ලද අතර, 2023 වර්ෂයෙන් පසුව මේ දක්වා සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා ගෙන නොමැති අතර, ඉදිරියේදී අත්තිකාරම් ලබා ගැනීමට සිදුවුවහොත් ප්‍රධාන ලේකම් ගේ පූර්ව අනුමැතිය ලබා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.
	සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුනි.	2025 වර්ෂය සඳහා මාර්තු 22,ජූනි 13, සැප්තැම්බර් 13 සහ දෙසැම්බර් 02 යන දිනවල විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත.
	අදාල අත්තිකාරම් කාර්ය සඳහා පළාත් සභාව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද නොතිබුනි.	අවම වියදම් සීමාව ඉක්මවා නොමැති අතර, ඉදිරියේදී අනිකුත් සීමා පිළිපැදීමට කටයුතු කරන බව දන්වමි.
දෙවැනි කොටස	සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට අඩු මට්ටමක පැවතුනි.	2024, 2025 වර්ෂවල කාර්යාලයේ සියළු දෙනා ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබාදී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : උඟව පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

පළමු කොටස -

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	ගැටලුව	ගත් පියවර හා වර්තමාන තත්ත්වය
492	වැටුප් සැකසීමට අදාළ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබීම	නිවැරදි කර ඇත
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට නිවැරදි කර ඇත.
	වාහන අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති අනුව කටයුතු නොකල අවස්ථා විය.	නිවැරදි කර ඇත
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	සීමාව ඉක්මවීමක් සිදුකර නොමැත.

දෙවන කොටස -

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය.අ.	ගැටලුව	ගත් පියවර හා වර්තමාන තත්ත්වය
492	වෙබ් අඩවියක් නොතිබීම හා මහජනයාට පැමිණිලි කිරීමට අවස්ථාව ලබා නොදීම.	අදාළ කටයුතු සිදු කරමින් පවතී.
	තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට නිවැරදි කර ඇත.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	නිවැරදි කර ඇත
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	පුහුණු අවස්ථා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පිරිස් පුහුණු ආයතනයෙන් සිදුකරනු ලබයි.
	ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	නිවැරදි කර ඇත

පාර්ලිමේන්තු මාලාවේ අංකය - 492

ආයතනයේ නම - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය	කමිටුව විසින් හඳුනා ගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග/ වත්මන් තත්වය
492	ලැබෙන වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිවැරදි කර යාවත්කාලීන කර ඇත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේවන විට අදාල අළුත්වැඩියාවන් සහ අබලි භාණ්ඩ අපහරණය, වෙන්දේසි කිරීම් ආදී තීරණ ක්‍රියාත්මක කර ඇත.
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතු වූ ශේෂ මේවන විට නිරවුල් කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි	ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට මේවන තෙක් නියමිත කාර්තුවට නියමිත පරිදි රැස්වීම් සිදු කරනු ලැබේ.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 ප්‍රකාරව කටයුතු කිරීම මත අත්‍යාවශ්‍ය කටයුතු සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබා දීමෙන් 737-3-2-2103 යන්ත්‍රෝපකරණ වැය විෂයන් ප්‍රතිපාදන 100% ඉතිරි වීම් සිදු විය. එමෙන්ම 737-3-3-1301 වාහන වැය විෂය ප්‍රතිපාදන ඉතිරි වීමට 2023.01.27 දිනැති 1/2023 දරණ රාජ්‍ය චක්‍රලේඛ ප්‍රකාරව පුනරාවර්තන වියදම් 6% ක් කපා හැරීම හා අත්‍යාවශ්‍ය වාහන නඩත්තු අවශ්‍යතා ඇති නොවීම හේතු විය. ප්‍රතිපාදන ශේෂ නොවීම පිණිස සැලසුම් හා නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2024.05.29 දිනැතිව හා 2025.01.04 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පිලිවෙලින් 01/2024හා 01/2024(1) චක්‍ර ලේඛ ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ලබා දෙන ණය අත්තිකාරම් අත්හැර දැමීම මත කටයුතු කර ඇත.

දෙවන කොටස

492	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටයම්/ අහිතකර මට්ටමේ විය.	කාර්යාලයේ 2023-2027 මධ්‍ය කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්ම මඟින් 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩලයෙන් 50% ට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12ක පුහුණු අවස්ථා තහවුරු කර තිබිණි. කෙසේ වෙතත්, ජාතික අයවැය චක්‍රලේඛ 1/2023 අනුව අත්‍යාවශ්‍ය පුහුණු අවස්ථාවකට පමණක් ඉඩ කඩ ලබාදෙන ලද අතර, එමඟින් කාර්යාලයේ සියළුම නිලධාරීන් සඳහා පුහුණු පැය 6ක් ආවරණය කරන ලදී. 2024 වසරේ සිට සෑම නිලධාරියෙකුටම වාර්ෂිකව පැය 12ක අවම ප්‍රහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශමාලා අංකය :- 492
ආයතනයේ නම :- ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශමාලා අංකය	කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා	හඳුනා ගත් දුර්වලතා ම හරවා ගැනීම සඳහා වර්තමානය වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග
492	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට නියමිත කාල වකවානුවලදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.
	සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි ඝන්තකයේ නොමැත.	මේ වන විට ඌව පළාත් ප්‍රධාන ලේකම් නමට පවරා නොගත් වාහන 05 ක් පවරා ගැනීමට කටයුතු සිදු කරන අතර අනෙකුත් වාහනවල ලියාපදිංචි සහතිකය ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
	වාහනයේ ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2025 වර්ෂයේදී වාහන දෙකක් අපහරණය කර ඇත.
	පළාත් මුල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමකාර්ය නිම වී දින 14 ක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	කාර්යය නිම වී ඇති දින 14 ක් ඇතුලත අත්තිකාරම් පියවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදන යම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	715-3-2-2104 වැය විෂයය සඳහා සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරි කර තිබුණි. වැය විෂයය සඳහා අක්මුදල් ලැබෙන ප්‍රමාණය මත ගිවිසුම්ගත වීම සහ අක්මුදල් නොලැබීම මත සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්තමානය වන විට 2023 වර්ෂයේ විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, සහ මිය ගිය අනෙකුත් දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවයි යුතු ණය ශේෂ අය කර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

දෙවන කොටස

492	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ ජූනි 30 දිනට පෙර යොමු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
	සැලසුම් ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවැතුණි.	2026 වර්ෂයේ දී සියලුම නිලධාරීන් ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටයම් / වයාවන මට්ටයම්/ අහිතකර මට්ටමේ විය.	විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු මහඟරවා ගැනීඹ සඳහා වර්තමානය වන විට කටයුතු සිදු කෙරෙමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව -අංක 492

ආයතනයේ නම - උඟව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශමාලා අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වත්මන් තත්වය
492	ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර, පවත්වාගෙන යාමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්ය නිම වී, දින 14ක් ඇතුළත නිරවුල් කරනු ලැබේ.
	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	අවුරුදු 02කට වැඩි සියළුම තැන්පත් මුදල් මේ වන විට පළාත් සභා මුදල් රීති ප්‍රකාරව කටයුතු කර ඇත.
	සමාලෝචිත වර්ෂය තුළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	විගණන කළමනාකරණ කමිටු රැස්වීම, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක DMA/01/2025 අනුව වර්ෂයට අදාළ කාර්තු අනුව, පැවැත්වීමට කටයුතු කර ඇත.
	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	අදාළ වැය විෂයන්වල අවශ්‍ය ප්‍රමාණවත් මුදල් වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ දී, ඉල්ලීමට කටයුතු කර ඇත.
